# භාණ්ඩ, පහසුකම් සහ සේවා සපයන සහ වෙනත් ආයතන වලදී සිදුවන, මව්කිරි දීම වෙනස්කොට සැලකීම සහ පීඩා කිරීම පිළිබඳ අත්පත්‍රිකාව



2021 ජූලි 19 වන දින සිට ලිංගිකත්වය මත වෙනස් කොට සැලකීමේ පනත මගින් මව්කිරි දීමේදී වෙනස්කම් වලට සහ පීඩා කිරීම්වලට ලක්වන කාන්තාවන් ආරක්ෂා කෙරේ.

වෘත්තීමය ස්ථාන හා ඒ හා සම්බන්ධ අංශවල මෙන්ම අනෙකුත් අංශ වල ආරක්ෂාව තහවුරු කෙරේ. ඒවා නම්:

- භාණ්ඩ, සේවා හා පහසුකම් සැපයීම
- අධ්‍යාපනය
- ආයතන කළමනාකරණය හෝ බැහැර කිරීම
- සමාජ ශාලාවල සහභාගීත්වය
- රාජ්‍ය ආයතන

## මව්කිරි දීම අර්ථ දැක්වීම

ලිංගිකත්වය මත වෙනස්කම් කිරීම් වලට භාජනය වීම පිළිබඳ ආඥාපනත (SDO) යටතේ මව්කිරි දීම මෙසේ හඳුන්වයි:

- තමාගේ හෝ තමාගේ නොවන දරුවකුට මව්කිරි දීමේ යෙදෙන කාන්තාවක්.
- දරුවා වෙනුවෙන් මව්කිරි දොවා තබන ක්‍රියාවෙහි යෙදෙන කාන්තාවක්.
- දරුවෙකුට මව්කිරි ලබා දී පෝෂණය කරන කාන්තාවක් නමුත් වෙනස් කොට සැලකීමට ලක් වන අවස්ථාවේ එම කාර්යයෙහි (මව්කිරි දීමෙහි) නොයෙදී සිටින කාන්තාවක්.

## මව්කිරි දීම වෙනස්කොට සැලකීමල පීඩා කිරීම සහ පළිගැනීම යනු කුමක්දැයි

මව්කිරි දීම වෙනස්කොට සැලකීම, පීඩා කිරීම සහ පළි ගැනීම විවිධ ආකාර වලින් සිදු විය හැකිය.

**සෘජුව සිදුවන වෙනස් කොට සැලකීම** - මෙයින් අදහස් වන්නේ විවිධ අවස්ථාවලදී මව්කිරි ලබාදෙන කාන්තාවන් හට, අනෙකුත් කාන්තාවන් (මව්කිරි ලබා නොදෙන කාන්තාවන්) හෝ පිරිමින් හා සසඳා බැලීමේදී ඔවුනට අඩු සැලකිල්ලක් ලැබීමයි.

> **උදාහරණය:** එමී අවන්හලක යහළුවන් සමගින් දිවා ආහාරය ගනිමින් සිටී. ඇය යහළුවන් බැලීමට පැමිණි අවස්ථාවේ ඇයගේ අලුත උපන් බිළිඳා ඇය සමගින් රැගෙන ආවා. ඇය බිළිඳාට මව්කිරි දීමට සැරසෙන අවස්ථාවේ වේටර් වරයකු පැමිණ, "මහත්මියණි, ඔබට අවන්හල තුළ මව්කිරි ලබාදීමට හැකියාවක් නොමැත. මා හිතනවා ඔබට පිටවෙන්නට සිදු වේවි කියා" යැයි පැවසීය. මෙහිදී අවන්හල විසින් ඒමීට සේවාව ලබාදීම ප්‍රතික්ෂේප කිරීම, සෘජුවම වෙනස්කොට සැලකීමට ලක් වූ අවස්ථාවක් ලෙස සඳහන් කළ හැක.

**වක්‍රාකාරයෙන් සිදුවන වෙනස් කොට සැලකීම** - මෙයින් අදහස් කෙරෙන්නේ මව්කිරි දෙනවාද නොදෙනවාද යන්න නොසලකා සියලුම පුද්ගලයන්ට අදාලවන පරිදි අවශ්‍යතාවයක් හෝ කොන්දේසියක් ලෙස හෝ පැනවීමයි. නමුත්;

- මේ සඳහා අනුගත විය හැකි මව්කිරි ලබාදෙන කාන්තාවන්ගේ අනුපාතය, එයට අනුගත විය හැකි මව්කිරි ලබානොදෙන කාන්තාවන්ගේ අනුපාතයට වඩා සැලකිය තරම් අඩුය;
- අවශ්‍යතාවයන් හෝ කොන්දේසි පිළිබඳ යුක්ති සහගත සාධාරණීයකරණයක් නොමැති වීම; හා
- අවශ්‍යතාවයන්ට හා කොන්දේසීන්ට අනුගත නොවිය හැකි මව්කිරි ලබාදෙන කාන්තාවන්ට හානියක් වේ.

**උදාහරණය:** සාප්පු සංකීර්ණයක එහි වැසිකිළිය හා ළදරුවන් සඳහා වූ කාමර සැමවිටම අගුළු දමා තබාගැනීමේ ප්‍රතිපත්තියක් ඇත. පහසුකම් භාවිතා කිරීමට කැමති ඕනෑම අයකු කළමනාකරණ කාර්යාලයට ගොස් කාමරය විවෘත කිරීම සඳහා යතුරු ලබාගත යුතු අතර භාවිතයෙන් පසු යතුර නැවත භාරදිය යුතුයි. කළමනාකරණ කාර්යාලය පිහිටා ඇත්තේ වැසිකිළි හා ළදරු කාමර වලට වඩා බොහෝ දුරින් බැවින් මෙය ළදරුවන් සමග ගමන් කරන කාන්තාවන්ට සැලකිය යුතු තරම් අපහසුතාවයක් ඇති කරයි. ඒ නිසා වැසිකිළි හා ළදරු කාමර අගුළු දමා තබා ගැනීමේ අවශ්‍යතාවය සෑම කෙනෙකුටම අදාල වුවද මව්කිරි දෙන කාන්තාවන්ට පීඩාකාරී ලෙස බලපාන අතර මෙම සිදුවීම මව්කිරි දෙන කාන්තාවන් වක්‍රාකාරයෙන් වෙනස් කොට සැලකීමට ලක් වන අවස්ථාවකි.

**මව්කිරි දීම පීඩාවට පත් කිරීම මව් කිරි දෙන කාන්තාවන් පීඩාවට පත් කිරීම දෙආකාරයකින් සිදු වේ. කාන්තාවක් පහත පදනම මත මව් කිරි දීමේදී යමකු විසින් පීඩාවට පත් කරන විට මෙය සිදු විය හැක.**

- **මව් කිරි දෙන කාන්තාව නොපිළිගන්නාසුලු ආකාරයෙන් හැසිරීම**

සාධාරණ පුද්ගලයෙක් විසින් කාන්තාව ලජ්ජාවට පත් වන ලෙස, වරදකාරී බවට පත් වන ලෙස හෝ බලපෑමට ලක් වන ලෙස අවස්ථානුකූලව දකින නොපිළිගන්නා සුලු හැසිරීමක්

- **විරුද්ධකාරී හෝ බලපෑම් ඇති කරන පරිසරයක් නිර්මාණය කිරීම**

යම් පුද්ගලයකු වෙනත් අයද සමග කාන්තාව වරදකාරී බවට පත් වන ලෙස හෝ බලපෑමට ලක් වන ලෙස හැසිරීමක් ඇති වන පරිසරයක් නිර්මාණය කිරීම

මෙම හැසිරීමට වාචිකව හෝ ලිඛිතව කාන්තාව ඉදිරිපිට යම් ප්‍රකාශයටක් කිරීම ඇතුළත් වේ.

**උදාහරණය:** ජෙනිස්, ඇගේ ස්වාමි පුරුෂයා සහ සිය අලුත උපන් බිළිඳාද සමග අවන්හලකට යයි. එහි ගිය වහාම ඇය ළදරුවාට මව් කිරි දීමට පටන් ගනියි. මව් කිරි දෙන අතර වේටර්වරු දෙදෙනෙක් මෙසේ කතා කරනු ඇයට ඇසෙයි. 'සමහර ගෑනුන් ප්‍රසිද්ධියේම මව් කිරි දෙන හැටි බලන්නත් අප්‍රියයි'. එවිට ජෙනිස් වෙත පැමිණෙන එක් වේටර් කෙනෙක් 'අපේ අවන්හලේ මව්කිරි දීම අසංවර හැසිරීමක් ලෙස දකිනවා, එයින් අනෙක් පාරිභෝගිකයන් ලජ්ජාවට පත් විය හැකියි'. මෙම හැසිරීමෙන් ජෙනිස් අපහසුවටත්, ලජ්ජාවටත් පත් වන අතර අවන්හලේ පාරිභෝගිකයකු ලෙස ඇය වෙත කරන ලද නීතිවිරෝධී මව් කිරි දීමට එරෙහි පීඩා කිරීමක් ලෙස මෙය දැකිය හැක.

**හිංසනයට ලක්වීම** - වින්දිතයා විසින් තමන්ට හෝ වෙනත් අයෙකුට පහත දැක්වෙන ආකාරයෙන් ක්‍රියාවන් සිදුකර ඇතැයි හෝ, සිදු කරීමට අදහස් කළේ යැයි හෝ, සිදු කරන ලද බවට සැක කර හෝ, සිදු කරනු ඇතැයි යන සැකයෙන් යම් පුද්ගලයෙකු විසින් (වෙනස්කම් කරන තැකැත්තා) වින්දිතයාට අන් පුද්ගලයන්ට සාපේක්ෂව අඩු සැලකිල්ලක් ලැබෙන සේ ක්‍රියා කිරීම මෙයින් අදහස් වේ.

- වෙනස්කම් කරනු ලැබූ පුද්ගලයාට හෝ වෙන යම් පුද්ගලයකුට SDO යටතේ නීතියට පටහැනි ආකාරයෙන් මව්කිරි ලබාදීම සම්බන්ධයෙන් කරන ලද වෙනස්කමක් හෝ පීඩාවට පත් කිරීම සම්බන්ධව චෝදනා කිරීම.
- වෙනස්කම් කරන ලැබූ පුද්ගලයාට හෝ වෙන යම් පුද්ගලයෙකුට SDO යටතේ මවුකිරි දීම සම්බන්ධයෙන් කරන ලද වෙනස්කම් හෝ පීඩාවට පත් කිරීම කරණ කොටගෙන ඔහුට/ඇයට විරුද්ධව නීතිමය පියවර ගැනීම.
- SDO යටතේ, මවුකිරි දීම මුල් කොට ගෙන වෙනස්කොට සැලකීම සම්බන්ධයෙන් වෙනස් කොට සැලකූ හෝ පීඩාවට පත් කිරීම කළ තැනැත්තාට හෝ වෙනත් පුද්ගලයෙකුට එරෙහිව ඕනෑම පුද්ගලයකු විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගයකට සාක්ෂි හා තොරතුරු ලබා දීම හෝ,
- මව්කිරි දීම මුල් කොට ගෙන වෙනස්කොට සැලකීම සම්බන්ධයෙන් එසේ කල තැනැත්තාට හෝ පීඩාවට පත් කිරීම කළ තැනැත්තාට විරුද්ධව SDO යටතේ වෙනත් කිසියම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබීම.

**උදාහරණ:** ජූඩි හොංකොං කන්ට්‍රි ක්ලබ් එකේ සාමාජිකාවකි. ඇය හා ඇයගේ ස්වාමිපුරුෂයා විසින් මෑතකදී පිරිමි ළදරුවකු හදාවඩා ගැනීමට ගත්තෝය. ඔවුන් දරුවා ද රැගෙන මේ සමාජ ශාලාවේහි ආහාර ගැනීමට පැමිණියෝය. ජූඩි ආපන ශාලාව තුළ දරුවාට මව්කිරි ලබා දෙන විට සේවකයෙකු පැමිණ ඇයට පවසන්නේ වෙනත් පුද්ගලයකු විසින් පැමිණිලි කිරීමට හැකියාවක් ඇති නිසා ආපන ශාලාව තුළ මව්කිරි දීමට අවසර නොමැති බවයි. මව්කිරි දීම වෙනස් කොට සැලකූ නිසාවෙන් ජූඩි විසින් සමාජ ශාලාවට විරුද්ධව පැමිණිලි කළාය. සති කිහිපයකට පසු සමාජ ශාලාව මගින් තමන් සිදුකල මව්කිරි දීම වෙනස් කොට සැකීමේ ක්‍රියාව නොසලකා, ඒ ගැන සඳහනක්වත් නොකර, ඇයගේ පැමිණිල්ල හේතුවෙන් අසාධාරණ ලෙස ඇයගේ සාමාජිකත්වය අහෝසි කර ඇති බව ලිපියකින් දන්වා යැවීය. මෙය මව්කිරි දීම වෙනස්කොට සැලකීම ඍජුව පෙන්නුම් කරන ලද අවස්ථාවක් වන අතරම, නීති විරෝධී හිංසනයක්ද වේ.

**සේවායෝජකයන්ගේ හා සේවාප්‍රධානියන්ගේ වගකීම :** සේවායෝජකයන් විසින් සේවකයන් හට තම අනුදැනුමකින් යුතුව හෝ තොරව රැකියා කාලසීමාව තුළ සිදුවන වෙනස්කොට සැලකීම් පිළිබඳව නීත්‍යානුකූලව වගකිව යුතුය. සේවකයකු විසින් කරනු ලබන වෙනස් කම් කිරීම් වලට සේවාදායකයා වගකිව යුතු නමුත්, සේවකයෙක් විසින් කරනු ලබන වෙනස්කම් කිරීම් මැඩලීමට සේවාදායකයා විසින් පියවර ගත්තේ නම් හෝ එය ඔප්පු කළ හැකි නම් එහිදී සේවාදායකයා වගකිව යුතු නොවේ.

එසේම ආයතනයක බලයලත් ප්‍රධානියාගේ නියෝජිතයකු විසින් වුවද බලධාරියාගේ අනුමැතිය මත යම් වෙනස් කොට සැලකීමක් සිදුවේ නම් (ප්‍රකාශ කිරීමක් හෝ ඇඟවීමක් /පූර්වාදර්ශයක් හෝ පෙර නිමිත්තක්) එය බලධාරියා විසින් සිදු කළා යැයි සැලකේ.

**වෙනස් කොට සැලකීම සඳහා කරන උපදේශනය හා පෙළඹවීම:** පුද්ගලයෙකු විසින් මව්කිරි දීම වැලැක්වීම වෙනුවෙන් මව්කිරි දීම වෙනස්කොට සැලකීමට තවත් පුද්ගලයකුට උපදෙස් දීම හෝ තවත් පුද්ගලයකු පෙළඹවීම නීති විරෝධී ය.

**නීති විරෝධී ක්‍රියාවන්ට සහාය වීම:** පුද්ගලයකු දැනුවත්ව තවත් පුද්ගලයෙකුට SDO යටතේ දැක්වෙන මව්කිරි දීම වළක්වාලීම සම්බන්ධයෙන් නීති විරෝධී ක්‍රියාවන් කිරීමට උපකාර කරයි නම් එම පුද්ගලයා හෝ කාන්තාව නීතිවිරෝධී ක්‍රියාවක් සිදුකළා යැයි SDO යටතේ ගණන් ගැනේ.

## භාණ්ඩ, පහසුකම් හා සේවා සැපයීම

රජයට හෝ රජයේ අනුබද්ධිත (මුදල් ගෙවා හෝ නොගෙවා) භාණ්ඩ, පහසුකම් හා සේවාවන් සපයන පුද්ගලයකු විසින්, මව්කිරි දෙන කාන්තාවකට වෙනස්කොට සැලකීම SDO යටතේ නීති විරෝධී වේ:

- ඇයට භාණ්ඩ, පහසුකම් හා සේවා ලබාදීම ප්‍රතික්ෂේප කිරීම හෝ හිතා මතා මග හැරීම; හෝ
- ඇයට ගුණාත්මක භාවයෙන් තොරව භාණ්ඩ, පහසුකම් හා සේවා සැපයීම, හෝ එසේ සැපයීම ප්‍රතික්ෂේප කිරීම හෝ හිතා මතා මග හැරීම.

  පහත පදනම මත කාන්තාවක් මව් කිරි දීමේදී ඇය පීඩාවට පත් කිරීම නීති විරෝධීද වේ

- කාන්තාවට භාණ්ඩ, පහසුකම් හෝ සේවාවන් සැපයීම හා අදාළව; හෝ
- ඇය විසින් භාණ්ඩ, පහසුකම් හෝ සේවාවන් ඉල්ලා සිටීමේදී හෝ භාණ්ඩ, පහසුකම් හෝ සේවාවන් ඇයට සැපයීම හා අදාළව

### පහසුකම් හා සේවා සඳහා උදාහරණ

- මහජනතාව හෝ කිසියම් ජන කාණ්ඩයක් සිටින ඕනෑම ස්ථානයකට ප්‍රවිෂ්ට වීමේ ඇති හැකියාව;
- හෝටලයක, නවාතැන් පොළක හෝ ඒ සමාන වෙනත් ස්ථානයක නවාතැන් ගැනීමට ඇති පහසුව
- බැංකු, රක්ෂණ, ණය හෝ මූල්‍යමය කටයුතු සඳහා පහසුකම් සපයන ස්ථාන
- අධ්‍යාපන පහසුකම්
- විනෝදාස්වාදය, වෙහෙස නිවීම සඳහා වූ පහසුකම්
- ප්‍රවාහන හෝ ගමනාගමන පහසුකම්
- ඕනෑම වෘත්තීමය හෝ ව්‍යාපාර සේවා සැපයීම්; සහ
- රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක හෝ රජය මගින් පිළිගත් ආයතනයක සේවාවන්.

**උදාහරණය:** සාරා තම දියණිය රැගෙන උද්‍යානයට පැමිණි අතර ඇගේ දියණිය හැඬීමට පටන් ගත්තාය. ඇයට බඩගිනි වී ඇතැයි තේරුම් ගත් සාරා උද්‍යානයේ වාඩි වී මව්කිරි දීමට පටන් ගත්තාය. උද්‍යානයේ ආරක්ෂක නිලධාරියා සාරා මව්කිරි ලබාදෙනවා දැක, ළදරු රැකවරණ කාමරයක් උද්‍යානය සතුව ඇති බවත්, ඇය විසින් උද්‍යානයේ විවෘත ප්‍රදේශ වල නොව ළදරු කාමරය ඒ සඳහා භාවිතා කල යුතු බවත් පවසයි. සාරා ඒ වන විටත් දැරියට මව්කිරි ලබාදෙමින් සිටින බැවින් එය ප්‍රතික්ෂේප කරයි. එවිට ආරක්ෂක නිලධාරියා පවසන්නේ මව්කිරි දීම නවතා, වහාම උද්‍යානයෙන් පිටව යන ලෙස යි. මෙය සෘජු ලෙස මව්කිරි දීම වෙනස් කොට සැලකූ අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. ළදරු රැකවරණ පහසුකම් තිබුණද බොහෝ කාන්තාවන් එය භාවිතා කිරීමට කැමැත්තක් දැක්වූවද මව්කිරි දෙන කාන්තාවන් එය භාවිතා කිරීමට බැඳී නොමැත. මව්කිරි ලබා දෙන කාන්තාවක් ළදරු ආරක්ෂක පහසුකම් තිබුනද ප්‍රසිද්ධියේ වුවද මව්කිරි ලබාදීමට උරුමකම් කියයි.

## භාණ්ඩ, පහසුකම් හා සේවා සපයන්නන් ගතයුතු යහපත් ක්‍රියාමාර්ග

### 1. මව්කිරි දීම පිළිබඳව වූ ලිඛිත ප්‍රතිපත්තියක් සකස් කිරීම.

මව්කිරි ලබා දෙන කාන්තාවන් දිරිගන් වන සහ ඒ සම්බන්ධව ආයතනයේ ස්ථාවරය හුවා දක්වන, සහ ඒ සඳහා හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම.

### 2. මව්කිරි දීම සඳහා පහසුකම් සැපයීම.

මව්කිරි දීම සඳහා මව්වරුන්ට අවැසි පහසුකම් ලබාදීම සහ අදාල පරිශ්‍රයන් තුල වඩා පෞද්ගලිකත්වයක් ඇති ස්ථාන ඇති කිරීම.

### 3. කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුව සැපයීම.

මව්කිරි දීමට හිතකර පරිසරයක් ලබාදීම සම්බන්ධයෙන්, ආයතනයේ ප්‍රතිපත්තිය හා ප්‍රතිපත්තියේ භාවිතය ගැන සියළුම කාර්යමණ්ඩලයේ සාමාජිකයන් දැනුවත් කල යුතුයි. කාර්යමණ්ඩල සාමාජිකයන් අදාල ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් හොඳ දැනීමකින් යුක්ත විය යුතු වන අතර මව්කිරි ලබා දෙන ස්ථාන හා පහසුකම් පිළිබඳව දැනුමක් තිබිය යුතුයි. මීට අමතරව මව්කිරි දීම සම්බන්ධයෙන් ඇතිවන පොදු ගැටළු සහගත අවස්ථා කළමනාකරණය කිරීමට දක්ෂ විය යුතුය.

### 4. මව්කිරි දීමේ ප්‍රතිපත්තිය හා නියමයන් ප්‍රචාරය කිරීම.

කිරි දෙන මව්වරුන්ට, මව්කිරි දීමට අවශ්‍ය වන විටදී ඒ සඳහා අවැසි පහසුකම් හා ක්‍රියාමාර්ග ආයතනයේ වෙබ් අඩවිය හෝ සමාජ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම. ඒ මගින් මව්කිරි ලබා දෙන කාන්තාවන්ට අදාල ආයතනයේ ඒ සම්බන්ධ පහසුකම් ලබා ගැනීම සඳහා දිරිමත් කිරීම.

## ළදරු රැකවරණ සහ මව්කිරි දීමට පහසුකම් ස්ථාපිත කිරීම

මව්කිරි දෙන කාන්තාවන් සඳහා ලබාදිය යුතු පහසුකම් SDO මගින් නියම නොකරයි. එසේ වුවද ළදරුවන් රැකබලා ගන්නා අයට සහ කිරි දෙන මව්වරුන් සඳහා වාණිජමය ගොඩනැගිලි වල ළදරු රැකවරණයට හා මව්කිරි දීම සඳහා ස්ථානයක් ලබා දිය යුතු බව රජය නිර්දේශ කරයි.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් වාණිජ ගොඩනැගිලිවල ළදරු රැකවරණය සහ මව්කිරි දීම සඳහා වූ විශේෂ කාමරයක් වෙන් කිරීම සම්බන්ධයෙන් නිශ්චිත මග පෙන්වීමක් ලබා දී ඇති අතර, ලබාදිය යුතු ළදරු ආරක්ෂක ස්ථාන සම්බන්ධයෙන් ගොඩනැගිල්ලේ ප්‍රමාණය පිලිබඳවත්, භාවිතා කරන්නන් සහ අමුත්තන්ගේ අවශ්‍යතාවය මත පදනම් විය යුතුයි යන්නත් අවම වශයෙන් එක් ගොඩනැගිල්ලකට එක් කාමරයක් හෝ ලබා දිය යුතුය යන්නත් සඳහන් කර ඇත.

තව දුරටත් මේ විශේෂ කාමරවල පිහිටීම (ගොඩනැගිල්ල තුල), ප්‍රමාණය, දළ සැලැස්ම සහ ගෘහනිර්මාණ මෙන්ම එම ස්ථානවල ක්‍රියාකාරිත්වය හා නඩත්තුව පිළිබඳවද නිර්දේශ සපයයි. ළදරු රැකවරණ කාමර පහසුකම් ස්ථාපනය කිරීමට ප්‍රථම එහි භාණ්ඩ, පහසුකම් හා සේවා සපයන්නන්ට ගොඩනැගිලි ඉදිකිරීමේ දෙපාර්මේන්තුව වෙතින් විමසීම් කිරීමට උපදෙස් ලබා දී ඇත. කෙසේ වෙතත් සනීපාරක්ෂක හේතුන් මත වැසිකිළි හා නාන කාමර මව්කිරි දීමට සුදුසු ස්ථානයක් නොවේ. ඒවා විකල්ප ස්ථානද නොවේ.

## මව්කිරි දීම සම්බන්ධයෙන් වෙනස් කොට සැලකීමට සහ පීඩාවට ලක්විය හැකි වෙනත් අංශ

### අධ්‍යාපන ක්ෂේත්‍රය

අධ්‍යාපන ආයතන, උදා: විශ්වවිද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතන තුළ මව්කිරි දෙනු ලබන කාන්තාවකට වෙනස්කොට සැලකීම නීතිවිරෝධී කාර්යයකි:

- මව්කිරි දෙන කාන්තාවකට, ශිෂ්‍යාවක් ලෙස බඳවා ගැනීමේදී ලබා දෙන කොන්දේසි අනුව හෝ;
- ශිෂ්‍යාවක ලෙස බඳවා ගැනීමට අදාල අයදුම්පත්‍රය භාර ගැනීම, ප්‍රතික්ෂේප කිරීම හෝ හිතා මතා මග හැරීම; නීති විරෝධී වේ.

තවද කාන්තාවක් මව් කිරි දීම මත පහත අවස්ථාවලදී කාන්තාවකට අධ්‍යාපන ආයතන මගින් හිංසා කිරීම නීති විරෝධී වේ:

- දැනට ආයතනයේ ශිෂ්‍යාවක වන හෝ වීමට අපේක්ෂා කරන කාන්තාවකට අධ්‍යාපන ආයතනයක වගකිවයුතු අංශයක් විසින් පීඩා කිරීම;
- දැනට ආයතනයේ ශිෂ්‍යාවක වන හෝ වීමට අපේක්ෂා කරන කාන්තාවකට අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩල සාමාජිකයකු විසින් පීඩා කිරීම;
- දැනට ආයතනයේ ශිෂ්‍යාවක වන හෝ වීමට අපේක්ෂා කරන කාන්තාවකට ආයතනයේ ශිෂ්‍යයකු විසින් පීඩා කිරීම; හෝ
- දැනට ආයතනයේ ශිෂ්‍යාවක වන හෝ වීමට අපේක්ෂා කරන කාන්තාවක් විසින් ආයතනයේ වගකිවයුතු සාමාජිකවකට (දැනට සාමාජිකාවක වන) හෝ ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකාවකට පීඩා කිරීම.

මව්කිරි දෙන කාන්තාවක් යම් ආයතනයක ශිෂ්‍යාවක් ලෙස සැලකුවත් එම ආයතනය මගින් එම කාන්තාවට වෙනස්කොට සැලකීම සිදු කරයි නම් එය නීති විරෝධී වේ.

- ඇයට ලබා දෙන ඕනෑම ප්‍රතිලාභයක්, පහසුකමක් හෝ සේවාවක් ලබා ගැනීම සඳහා ප්‍රවේශය ලබා දීම හෝ ඇයට ඒවාට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කිරීම හෝ හිතාමතා මග හැරීම; හෝ
- වෙනත් ඕනෑම කරුණක් හේතුවෙන් ඇයව ආයතනයෙන් බැහැර කිරීම හෝ වෙනත් ඕනෑම හානිකර ක්‍රියාවක් නීති විරෝධී වේ.

### ආයතන කලමනාකරණය හා විකිණීම

හොංකොං හි ඇති ආයතනයන් සම්බන්ධව යම් පුද්ගලයකු (විකිණීම, කුලියට දීම, බදු දීම හෝ කොටසක් බදු දීම යන අවස්ථා වලදී) මව්කිරි දෙන කාන්තාවකට එරෙහිව වෙනස්කොට සැලකීම නීති විරෝධී වේ.

- එම පුද්ගලයා විසින් අදාල කාන්තාව සඳහා කොන්දේසි ලබා දෙන ආකාරය අනුව;
- එම පුද්ගලයා විසින් ඇයගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමෙන්; හෝ
- වෙනත් ආකාරයකින් වෙනස්කොට සැලකීම නීති විරෝධී වේ.

නිවාස හිමියාට හෝ වෙනත් පුද්ගලයකු මව්කිරි දෙන කාන්තාවකට එම පරිශ්‍රය විකිණීම, කුලියට දීම වෙනත් ආයෙකු විසින් වලක්වයි නම් එය නීති විරෝධී වේ. බලපත්‍රයක් හෝ

හිමිකරුගේ කැමැත්තක් මත හෝ වෙන යම් පුද්ගලයෙකුගේ අවශ්‍යතාවයක් මත හෝ කටයුතු කරයි නම් එමගින් මව්කිරි දෙන කාන්තාවට වෙනස්කොට සලකයි නම් ඒ නීති විරෝධී කරුණකි. (උදාහරණ: කුලී නිවැසියන් හෝ අනු කොටස් බදු දීම).

පරිශ්‍රයක් සම්බන්ධයෙන් පහත දේවල්ද නීති විරෝධී වේ:

- කාන්තාවට පරිශ්‍රය සැපයීමට ඉදිරිපත් වීමේදී හෝ සැපයීමේදී කාන්තාව මව් කිරි දීම පදනම් කරගෙන ඇයව ඉවත දැමීමට හෝ පීඩාවට ලක් කිරීමට යම් පුද්ගලයකුට බලය තිබීම;
- පරිශ්‍රයේ සිටින කාන්තාව මව් කිරි දීම මත පරිශ්‍රය කළමනාකරණය කරන පුද්ගලයා විසින් ඇයව පීඩාවට පත් කිරීම; හෝ
- කුලී නිවැසි බව හා අදාළව කාන්තාවක් මව් කිරි දීම මත, ඇයට හිංසා කිරීම, ගෙවල් හිමිකරුගේ හෝ වෙනත් අයකුගේ බලපත්‍රයක් ඇයව ඉවත් කිරීම සඳහා අවශ්‍ය වන විට ඇයව ඉවත් කිරීමට බලපත්‍රයක් ඉල්ලා සිටීම.

## සමාජ ශාලාවලට සහභාගි වීම

මව්කිරි ලබාදෙන කාන්තාවකට සමාජ ශාලාව විසින්, සමාජ ශාලාවේ කළමනාකරණ කමිටුව විසින් හෝ කමිටුවේ සාමාජිකයකු විසින් වෙනස් කොට සලකයි නම් එය නීති විරෝධී වේ.

- ඇයට සාමාජිකත්වය ලබාදීම සමාජ ශාලාව විසින් ප්‍රතික්ෂේප කිරීම; හෝ.
- ඇයට සාමාජිකත්වය ලබාදීම වෙනුවෙන් කොන්දේසි නිකුත් කිරීම.

වර්ථමාන සාමාජිකත්වය හිමි මව්කිරි දෙන කාන්තාවකට සමාජ ශාලාව විසින්, සමාජ ශාලාවේ කළමනාකරණ කමිටුව විසින් හෝ කමිටුවේ සාමාජිකයකු විසින් වෙනස් කොට සැලකීම නීති විරෝධී වේ.

- සාමාජිකත්වය වෙනුවෙන් කොන්දේසි නිකුත් කිරීම.
- යම්කිසි පන්තියක්/කොටසක් සඳහා සාමාජිකත්වය දීම ප්‍රතික්ෂේප කිරීම.
- සමාජ ශාලාවට පිවිසීම/පහසුකම් හා සේවා අවහිර කිරීම හෝ අවම කිරීම.
- සාමාජික දීමනා අවම කිරීම.
- වෙනත් ආකාරයකින් හානි කිරීම.

යම් සමාජයක සමාජයේ සාමාජිකාවක් වීමට අයදුම් කර ඇති කාන්තාවක් මව් කිරි දීම මත සමාජයේ කළමනාකරණ කමිටුව විසින්, එහි කළමනාකරණ කමිටුවේ සාමාජිකයකු විසින් පීඩාවට ලක් කරීම නීති විරෝධී වේ.

## රජය

රජය මගින් එහි බලතල ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම රජය විසින් භාණ්ඩ, පහසුකම්, සේවා සැපයීමේදී හෝ අධ්‍යාපනය ලබා දීමේදී හෝ මව්කිරි දෙන කාන්තාවකට වෙනස් කොට සලකයි නම් එය නීති විරෝධී වේ.

## මව්කිරි දීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම

### කළ යුතු දෑ

- ✓ කිරි දෙන මවකට ඕනෑම වෙලාවක, ඕනෑම ස්ථානයක මව්කිරි දීමේ ඇති නිදහසට ගරු කිරීම.
- ✓ ආරක්ෂිත පරිසරයක් නොමැති නම් හෝ ගමන් මාර්ගයට බාධා වීමක් සිදු නොවේ නම් හැර මව්කිරි දෙන කාන්තාවකට බාධා නොකිරීම.
- ✓ මව්කිරි ලබා දෙන මවකට, මව්කිරි දීම සඳහා වැඩි පෞද්ගලික ආරක්ෂාවක් ඇති ස්ථානයක් ලබා දීමට කටයුතු කිරීම.
- ✓ අනෙකුත් පාරිභෝගිකයන්ට හා සේවා භාවිතා කරන්නන්ට කිරි දෙන මව්වරුන් ගැන හා ළදරුවන්ගේ අවශ්‍යතා පිළිබඳව පැහැදිලි කිරීම.

### නොකළ යුතු දෑ

- × කිරි දෙන මවකට මව්කිරි දීම නැවැත්වීමට, සඟවා ගැනීමට, හෝ ආයතන පරිශ්‍රයෙන් පිටවී යන ලෙස ප්‍රකාශ කිරීම.
- × ආයතන පරිශ්‍රයේ ඇති ළදරු ආරක්ෂණ කාමරයට යා යුතු යැයි අවධාරණය කිරීම.
- × වැසිකිළිවල දී තම දරුවන්ට මව්කිරි ලබාදෙන ලෙස මව්වරුන්ට පැවසීම.

## මව්කිරි දීමට හිතකර පරිසරයක් ඇති කිරීම සඳහා සම්පත්:

- සම අවස්ථා කොමිසමේ, රැකියා හා අදාල අංශ වල මව්කිරි දීම පිළිබඳ මාර්ගෝපදේශය.
- සම අවස්ථා කොමිසමේ භාණ්ඩ, පහසුකම් සහ සේවා සැපයීමේ දී මව්කිරි ලබාදීම පිළිබඳව මගපෙන්වීම.
- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල මව්කිරි දීම සඳහා හිතකර පරිසරයක් පිහිටුවීම නම් වූ මාර්ගෝපදේශය.
- ගොඩනැගිලි ඉදිකිරීම් දෙපාර්තමේන්තුව ADV-32 මගින්, වාණිජමය ගොඩනැගිලි වල මව්කිරි දීම සඳහා සහ ළමා රක්ෂණ කටයුතු සඳහා කාමර නිර්මාණය කිරීමට අවශ්‍ය පුහුණු කිරීමේ සටහන් බලයලත් පුද්ගලයින්, ව්‍යුහාත්මක ඉංජිනේරුවන් හා ලියාපදිංචි හු තාක්ෂණික ඉංජිනේරුවන් හට ලබාදීම.

## ඔබ මව්කිරිදීමේ වෙනස්කම්වලට හෝ පීඩාවට ලක් වුවහොත් ඔබට කුමක් කළ හැකිද?

මව්කිරි දීම නිසාවෙන්, ඉහත සඳහන් අංශ වලට අදාල ව වෙනස් කොට සලකා ඇති හෝ පීඩාවට ලක් කර ඇති බව දැනෙන ඕනෑම අයෙකුට පහත සඳහන් කර ඇති ඕනෑම ආකාරයකට හෝ EOC වෙත ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය.

තැපැල් මගින් EOC වෙබ් පිටුව හරහා [(Online form on the EOC website)]

ෆැක්ස් EOC කාර්යාලයට පැමිණීමෙන්

ප්‍රති-වෙනස්කොට සැලකීමේ ආඥා පනත පිළිබඳ විමසීම්: On-line Enquiry Form
ප්‍රති-වෙනස්කොට සැලකීමේ ආඥා පනත පිළිබඳ පැමිණිලි: On-line Complaint Form
EOC සේවයන් පිළිබඳ විමසීම් සහ පැමිණිලි : On-line Form

---


වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ වීමට:

**සම අවස්ථා පිළිබඳ කොමිසම**

| | |
|---|---|
| දුරකථන: | (852) 2511 8211 (සාමාන්‍ය විමසීම් සඳහා පමණි) |
| ෆැක්ස්: | (852) 2511 8142 |
| ලිපිනය: | 16/F, 41 Heung Yip Road, Wong Chuk Hang, Hong Kong. |
| විද්‍යුත් තැපෑල: | eoc@eoc.org.hk (සාමාන්‍ය විමසීම් සඳහා පමණි) |

කෙටි පණිවිඩ සේවාව: 6972566616538 (ශ්‍රවණාබාධිත හෝ භාෂණයේ දුෂ්කරතා ඇති පුද්ගලයින් විසින් සිදු කරන විමසීම් සඳහා පමණි.)


(වෙනස් කොට සැලකීමට අදාළ විමසීම් හා පැමිණිලි සඳහා ඉහත අන්තර්ජාල පෝරම භාවිතා කිරීමට සැලකිලිමත් වන්න)

平 等 機 會 委 員 會
EQUAL OPPORTUNITIES COMMISSION


අප්‍රේල් 2021


සටහන: මෙම පත්‍රිකාව නිර්දේශයක් පමණක් වන අතර කිසියම් වූ ආකාරයක නීති උපදේශයක් සඳහා ආදේශයක් ලෙස භාවිතා නොකල යුතුය.